# පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
# බස්නාහිර පළාත
மாகாணசுகாதாரசேவைகள்பணிப்பாளர் அலுவலகம்
மேல் மாகாணம்
**OFFICE OF THE PROVINCIAL DIRECTOR OF HEALTH SERVICES**
**WESTERN PROVINCE**


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WP/PD/ES/5/වාර්ෂික ස්ථානමාරු | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | දිනය<br>திகதி<br>Date 2024.12. 12 |

ප්‍රා.සෞ.සේ.අධ්‍යක්ෂ,
කොළඹ/ගම්පහ/කළුතර

**<u>බස්නාහිර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අක්ෂි තාක්ෂණවේදී/බන්තුරේඛණ ශිල්පී/ ඖෂධ සංයෝජක නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු - 2024</u>**

උක්ත තනතුරුදාරී නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු 2024 බස්නාහිර පළාත් කාර්ය පටිපාටික රීතිවල විධිවිධාන අනුව සිදු කර අදාළ ස්ථානමාරු ලැයිස්තුව ප්‍රකාශයට පත් කර ඇත. පසුව එකී ස්ථානමාරු සම්බන්ධයෙන් ඉදිරිපත් වී තිබුණු අභියාචනා සළකා අභියාචනා කමිටු තීරණයන්ද මේ වන විට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් නිකුත් කර ඇත.

02. ඒ අනුව, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කළ නිලධාරීන් අදාළ අභියාචනා තීරණයන්ට අනුව කටයුතු කළ යුතු අතර, අනෙක් නිලධාරීන් 2024 වර්ෂයට අදාළව ස්ථානමාරු නියෝග අනුව 2025.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය. ස්ථානමාරු නියෝග ලැබූ නිලධාරීන් වාර්ෂික ස්ථානමාරු චක්‍රලේඛ ප්‍රකාරව අනුප්‍රාප්තිකයා පැමිණෙනතුරු බලා නොසිට (නව අනුප්‍රාප්තිකයකු ලද පසු ස්ථානමාරු නියෝග හැර) නව සේවා ස්ථානවල රාජකාරියට වාර්තාකල හැකි වන පරිදි ඒ ඒ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල සහ රෝහල් සේවයෙන් නිදහස් කිරීම අදාළ ආයතන ප්‍රධානීන්ගේ වගකීම බව අවධාරණය කර ඇත.

03. තවද, මෙම ස්ථානමාරු ක්‍රියාත්මක කර 2025.01.20 දින වන විට අදාළ ප්‍රගතිය මා වෙත වාර්තා කිරීමට කටයුතු කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

වෛද්‍ය ධම්මිකා ජයලත්
බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

පිටපත් :

01. ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.)
02. අංශ ප්‍රධානී, තොරතුරු තාක්ෂණ අංශය – ප.සෞ.සේ.අ.කාර්යාලය (බ.ප.) - මෙම ලිපිය කාර්යාලයීය වෙබ් අඩවියෙහි පල කිරීම සඳහා
03. ලේකම් - රජයේ බන්තුරේඛණ ශිල්පීන්ගේ සංගමය– කා.දැ.ගැ.පි. සහ අ.ක.ස.
04. ලේකම් - රජයේ අක්ෂි තාක්ෂණවේදීන්ගේ සංගමය – කා.දැ.ගැ.පි. සහ අ.ක.ස.
05. ලේකම් - රජයේ ඖෂධ සංයෝජක නිලධාරීන්ගේ සංගමය – කා.දැ.ගැ.පි. සහ අ.ක.ස.


| | කාර්යාලය<br>அலுவலகம்<br>Office | පළාත් අධ්‍යක්ෂ<br>மாகாணபணிப்பாளர் Provincial Director | සැලසුම් අංශය<br>திட்டக்கூறு<br>Planning Unit | නි.අධ්‍යක්ෂ(පාලන)<br>பிரதிப்பணிப்பாளர் (நிர்வாகம்)<br>Deputy Director(Admin) | ප්‍රධාන ගණකාධිකාරී<br>Chief Accountant | පරිපාලන නිලධාරී<br>Adm. Officer |
|---|---|---|---|---|---|---|
| T.P | 0112434660 | 0112437154 | 0112478677 | 0112434852 | 0112417155 | 0112478463 |
| Fax | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 | 0112478472 |
| e-mail | info@healthdept.wp.gov.lk | pd@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | | | |

මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය,තැ.පෙ.376,කොළඹ 10 மாளிகாவத்தை செயலகம்,த.பெ இல.376,கொழும்பு 10 Maligawatta Secretariat Building, P.O. Box 376, Colombo 10.
www.healthdept.wp.gov.lk


CamScanner